## 2.21 සමචතුරස්‍ර පිරමීඩයක ලම්බ උස සෙවීමේ උපකරණය



හැඳින්වීම :- විනිවිද පෙනෙන ද්‍රව්‍ය වලින් සැදි සංවෘත පිරමිඩයක් වන මෙහි ඇතුළතින් ලම්භක උස පරිමාණයක් සවිකර ඇත. පිරමිඩයක ලම්බ උස ප්‍රදර්ශනය කිරීමට සැකසූ උපකරණයකි.

භාවිත කළ හැකි අවස්ථා :-

| ශ්‍රේණිය | පාඩම | ඉගෙනුම් ඵලය |
|---|---|---|
| 10 | ඝණ වස්තුවල පෘෂ්ඨ වර්ගඵලය | පිරමීඩයක මිනිතය |
| 11 | ඝණ වස්තුවල පරිමාව | පිරමීඩයක මිනිතය |

ගුරු උපදෙස් :-

පිරමීඩයක උස, ත්‍රිකෝණයේ ලම්බ උස, ඇල දාරයේ දිග ආදර්ශනය කර පෙන්වන්න

සිසු උපදෙස් :-

1. පිරමීඩයේ ත්‍රිකෝණාකාර මුහුණතක ලම්බ දුර මැනගන්න.
2. පිරමීඩයේ ලම්බ උස ඉගෙනුම් ආධාරයේ මිනුම් පටියෙන් ලබාගන්න.
3. පිරමීඩයේ ආධාරකයේ පැත්තක දිග ඉහත මිනුම් ආශ්‍රයන් ගණනය කරන්න.
4. පිරමිඩයක ආධාරකයේ දිග මැන ඔබේ පිළිතුර සමග සසඳා බලන්න.